ඈත අතීතයෙහි බරණැස් නුවර
එක් සිටුවරයෙක් විසීය.
ඔහු ධනවන්ත ය,
දානශීලී ය,
ශීලවන්ත ය,
කරුණාශීලී ය.
ඔහුගේ බිරිඳ ද
දරුවෝ ද
පරිවාර ජනයා ද
එසේ ම සිල්වත් වූහ.
යහපත් පිරිවරක්
ඇතිව සිටි බැවින්
'සුචිපරිවාර' යන නම
මේ සිටුවරයාට ලැබිණ.

(c) Sumitha Publishers

දිනක් ඔහු මෙසේ සිතුවේය.
"මටත් වඩා
සිල්වත් කෙනෙක්
මා ළඟට පැමිණියහොත්
මම ඔහුට නවාතැන් දෙමි.
ඔහුට නිදා ගැනීමට
අලුත් ම ඇඳක් දෙමි."
මෙසේ සිතූ ඔහු
තම කාමරයට යාබදව
විශේෂ කාමරයක් සදා
එහි යහනාවක්
පිළියෙළ කොට තැබීය.




(c) Sumitha Publishers


(c) Sumitha Publishers